කෙටි කතාව

# වරක් අම්මා කියන් නුඹ මට....



**නිරංජලා මනෝහාරී**
- සයිප්‍රසය

අඳුර දසතින් පැතිර ඇත. වීදිය පුරා දැල්වුන නියොන් එළිවල මලානික වූ පැහැය ගතේ වූ තෙහෙට්ටුව දෙගුණ කරවයි. තව සැතපුම් කාලක්වත් අඩුම තරමින් පයින් ගාටන්නට සිදුවන බව මතක් වෙන විට සිතේ කෝපයක් ද පැන නගී. කෝප වෙනවානම් නියතවම මා කෝප විය යුත්තේ මා සමඟමය. සමරේට නියමිතව තිබූ රාජකාරීය කැමැත්තෙන් මා වෙත පවරාගෙන කාර්යාලයේ මෙතෙක් පමා වුණේ මගේම කැමැත්තෙන් බැවින් වෙනත් කිසිවෙකු සමඟ කෝපවී පලක් නැත. "

"දෙයියනේ... මං බයවුන තරමක් දැනුයි ලේ ඉනුවෙ ඇඟට." උපාධ්‍යා සැනසුම් සුසුමක් හෙලමින් බෑගය මා අතින් ගත්තාය. මට මොහොතකට ඇය ගැන දුකක් සිතින.
"කෝ දුව පේන්න නැත්තෙ." සාලයට කර පෙවුවද දුව නොදුටු බැවින් මම විමසිමි. ""
මෙච්චර වෙලා බලාගෙන හිටිය. කෑවෙත් නෑ. නින්ද ගිහින්ද දන්නෙ නෑ. මං බලන්නම්. ඔයා තේ එකක් බොනවද නැත්නම් එක සැරේම කනවද?"
"මං වොෂ් එකක් දාගෙන එන්නම්. එක සැරේම කමු. හරි මහන්සියි. බඩගිනියි. ළමයටත් කතා කරන්න කන්න."

රාත්‍රී කෑම මේසය සූදානම්ව තිබුනද කෞමදී කෑමට නාවාය. මම කාමරයට කර පෙවිමි. " පුතා... ඔයා නිදිද කන්න එන්න." "මට ඕන්නෑ" " ඇයි... මොකක් හරි ප්‍රශ්නයක්ද?" "තාත්තිට කෝල් එකක් දෙන්න තිබුන්නැද්ද? මං චමෝදිලාගෙ ගෙදර යන්න තාත්ති එනකල් බලාගෙන හිටියා."
'මට වැඩ ළමයො. අම්මත් එක්ක යන්න තිබුනනෙ හදිසියක් නම්."
"හිටියනම් යනවා තමා. තාත්ති එනකල් ඉන්නෑ." මගේ හිත තිගැස්සින.

මෑතක සිට කෞමදි නපුරු වදන් පිට කරයි. ඇනුම්පද පවසයි. ඇය පැවසූ රළු වදන් උපාධ්‍යාට ඇසුනාදැයි මසිතට චකිතයක් දැනින. උපාධ්‍යා සන්සුන් දෙනෙතින් කෑම මේසය අසලට වී මා දෙස නෙත් යොමා සිටියාය. "ඔයා ඇවිත් කන්න" වැනි ආරාධනයක් ඇගේ දෙනෙතෙහි විය. මම නිහඬව කෑම මේසයට නෙත් හෙලිමි. ඇය එළවළු බතක් පිස ඇත. දුව එළවළු බස් කෑමට ප්‍රිය බව ඇය දනී. මම නැවතත් කාමරයට එබුනෙමි.
"මට බඩගිනියි." කෞමදි මගෙ අතේ එල්ලීගෙනම එළියට ආවාය. ඇය තවමත් සුරතල්ය. කර උස්මහත් වීද මට තවමත් සිතෙන්නේ ඇය මගේ අතේ එල්ලීගෙන පාසල ගිය පුංචි දුව කෞමදි ලෙසටමය. අප්‍රමාණ සෙනෙහසකින් මගේ හදවත පිරී ගියේය. මම දුවගේ හිස පිරිමැද මා වෙතට ඇද සිපගතිමි. උපාධ්‍යාගේ වතෙහි සැහැල්ලු සිනහවක් ඇඳී මැකී ගියේය.
විඩාබර ගතෙහි තෙහෙට්ටුව නිවන පිණිස මම නෙත් පියා ගතිමි. සුජාතාගේ වුවනත මසිත ඇඳින. කොතැනක හෝ සිට ඇය අප දෙස බලනවා වන්නට ඇත. ඇය මියගොස් පස් වසරක් ඉක්ම ගියද ඇගේ මතකය තවමත් ජීවමානව මසිත රැඳී පවති. උපාධ්‍යාගේ ආගමනය මගේ ජීවිතයට අමුතු වෙනසක් එක් නොකලාය. දස හැවිරිදි දියණියගේ ආරක්ෂාව පතා නැවත විවාහයක බැඳිය යුතු වන බව එකල සියල්ලම පැවසූ බැවින් මම උපාධ්‍යා සමඟ විවාහ වීමට එකඟතාවය පල කළෙමි.

"දුප්පත් කෙල්ල... මතක ඇති කාලෙක ඉඳලා වින්දෙ දුක්. අම්ම තාත්තා නැතිවෙනකොට මෙලෝකෙ හසරක් තේරෙන්නෙ නෑ. අපේ අම්ම හොස්ටල් එකට දාලා ඉගැන්නුව හින්ද රස්සාවක් කරගෙන ඔය ජීවත් වෙනවා. සුරේටයි දුවටයි කිසි වෙනස්කමක් නොකරයි කියලා මට විශ්වාසයි. මං උපාධ්‍යාව සුරේට කථා කරන්නද?" සිය ඥාති සොයුරියක වූ උපාධ්‍යා ගැන සමරේ පැවසුවේ එපරිදිය. මගේත් කෞමදීගෙත් පාළු ජීවිතයට උපාධ්‍යා පැමිණියේ එලෙසය.

සැබවින්ම ඇය යහපත් බිරිඳක වූවාය. නිහඬව සියළු වතාවත් ඉටු කොට තමාගේ දෙයක් බලාගත්තාය. මගේ දුව කෞමදී නිසාම රැකියාවෙන්ද ඉවත් වූවාය. කෞමදි ඇයට වෙනස්කමක් කරනු දකින්නට මම අකමැත්තේද එනිසාමය. නමුදු දැන් දැන් කාර්යාල කටයුතු අවසන්ව පැමිණෙන සෑම සන්ධ්‍යාවක්ම සිත් තැවුලෙන් ගත කරන්නට මට සිදුව ඇත. කෞමදි කොයි ලෙසකින්වත් උපාධ්‍යා නොරුස්සයි. ඉවසීමේ සීමාව ඉක්මවා ගිය දිනෙක ඔවුන් අතර ගැටුමක් ඇතිවෙතැයි මට නොයෙක් වර සිතේ. පැහැදිලි විසඳුමක් ලබාගත නොහැකි ගැටළුවක මම සිරව ඇත. මගෙ ජීවිතයම හා සමාන කෞමදි මෙන්ම කිසිඳු කනස්සල්ලකින් තොරව අපගේ වතාවත් ඉටු කරන අසරණ උපාධ්‍යාද හැර දමන්නට මට නොහැකිය.

"තාත්ති... මට කැමති තැනක මට යන්න බැරි ඇයි. මං හිරකාරියෙක්ද? මගේ යාළුවන්ගෙ ගෙවල්වල යන්න මට බැරි ඇයි. එක්කො මං යන්නම්. නැත්නම් අරයට යන්න කියන්න." දිනක් කෞමදී එඩිතරව සිය හැඟීම් ප්‍රකාශ කළාය.

"ඔයා කැමති තැනක යන්න පුළුවන් කාලෙට මං කියන්නම්. එතකොට යන්න. තමා ඔයා ඉන්නෙ අපි යටතේ. හොඳට ඒක මතක තියාගන්න." මම ඇඟිල්ල දික් කොට පැවසීමි. වේදනාව, තරහ මුසුව මගෙ කම්මුල්වල මස්පිඬු නළියන්නට විය. කෞමදි මදක් පසු බෑවාය. ඇයගේ දෙනෙත රතුවිය. ලොකු කඳුළු බිඳු දෙකක් මතුවී ඇයගේ රතුවනු දෙනෙතින් එළියට පැන කම්මුල් මත බේරී ගියේය.

"තාත්තිට මං යටත් වෙන්නම්. ඒත් පිට ගෑනුන්ට යටත් වෙන්න මට බෑ තාත්ති." මදක් නිවුන මෙන්ම දැඩි ස්වරයෙන් පැවසූ කෞමදි කාමරයේ තිර රෙදි අතරින් නොපෙනී ගියාය.
මුළුතැන්ගෙයි උළුවස්ස අසලින් මෑත්ව ගිය උපාධ්‍යාගේ සෝබර වත මොහොතකට මසිත කළඹාලීය. වෙනත් පවුලක නම් සිදුවනු ඇත්තේ මෙහි කනපිටය. කුඩම්මාගේ අතවර විඳින දූවරුන් ගැන අසන යුගයක උපාධ්‍යා සිය සුළු දියණියගේ අතවරයනට ලක්ව සිටින්නීය. මගේ හිස යකාගේ කම්මල වැනිය. කෞමදී කුමක් කීවද උපාධ්‍යා නෑසුනා සේ සිටින්නීය. එක අතකට ඇයට එසේ සිටින්නට පුළුවන්නම් මම මේ ගැන කලබල විය යුතු නැත.

දින කිහිපයක් නිසොල්මන්ව ගෙවී ගියේය. එය සෙනසුරාදාවක් විය. කලින්දා රාත්‍රියේ සාදයකට සහභාගි වී මත්පැන් පානය කළ බැවින් දරුණු හිසදරයකින් පෙළෙන්නට මට සිදුවිය. දැඩි තෙහෙට්ටුව නිසාම මම සයනයෙහිම රැඳී සිටියෙමි.
"තාත්තී..." කෞමදි කාමරයට පැමිණියාය. ඇයගේ දෙනෙත ඉදිමි තඩිස්සි වී තිබිණ. "
"ඇයි මගෙ මැණික" මම වහා නැගිට ඉඳගතිමි. මා අසලින් බිම දණ ගැසූ කෞමදි මගේ උකුලෙහි හිස හොවා හඬා වැටෙන්නට පටන් ගති.
"මට සමාවෙන්න තාත්ති..." ඇයගේ දෙවුර තදින් ගැස්සින. ඉකිබිඳුම විලාපයක ස්වරය ගනී. මට කිසිවක් වටහා ගත නොහැක.
"කියන්න දුව ඇයි මේ... පුතා නැගිටින්න. අඬන්නෙ ඇයි.."
මම කෞමදි ඔසවමින් පැවසුවෙමි. ඇය ගුලි කරගෙන සිටි අත්ල මා වෙත පෑවාය. එහි පොඩිවුන කොලයක් විය. මම එය දිග හැරිමි.
"ආදරණීය දුවේ," එහි වූයේ ලිපියකි. උපාධ්‍යා විසින් දුව වෙත ලියන ලද්දකි. මට කිසිවක් වටහා ගත නොහැකි ය.

ආදරණීය දුවේ... ඔයාට මේ ලිපිය ලැබෙන විට මම ඔයාලගෙන් ගොඩක් ඈතකට ගිහින්. මම දන්නව ඔයාට මාව ලොකු හිසරදයක් කියල. වදයක් කියල. ඉතින් අදින් පස්සේ මගෙ දුව මේ සියළු කරදරවලින් නිදහස්. මම හරි ආසාවෙන් හිටිය යාළුවෙක් එක්ක වගේ ඔයාට මගේ හිතේ තියෙන දේවල් කියන්න. ඔයා ලඟට වෙලා කියව කියව ඉන්න. ඔයා කියන දේවල් අහගෙන ඉන්න. ඒත් ඔයාට මම ඔයාගෙ කවුරුත්ම නෙවෙයි පිට ගෑනියෙක් කියල ඔයාගෙම කටින් ඇහුවට පස්සෙ මට තේරුණා කවදාවත්ම මට ඔයාව ලැබෙන්නෙ නෑ කියලා.

පුංචි කාලෙ ඉඳලම මටත් අම්ම තාත්තගෙ සෙනෙහස ලැබුනෙ නෑ දුවේ. මම ඒ දුක වචනයේ පරිසමාප්තයෙන්ම දන්නව. දුවට පුංචියටවත් වෙනස්කමක් නොකරන්න මං තීරණය කෙරුවෙ මම මේ ගෙදරට ආව දවසෙ ඉඳලමයි. මම මට පුළුවන් විදියට දුවගෙ දුක සැප සොයා බැලුවා. ඒත් දුව කවදාවත්ම මාව තේරුම් ගන්න උත්සහ කෙරුවෙ නෑ. කවදහරි දුව ලොකු මහත් වුන දවසක මාව තේරුම් ගනියි කියල මම බලාගෙන හිටිය. මගේ කුසින් දරුවෙකු වදන්න මට හරිම ආශාවක් තිබුණත් මං ඒ ආසාව දරාගත්තෙත් දුවට වෙනස්කමක් වෙයි කියලමයි.

ඉතින් මම මගේ දුවත් එක්ක පොඩ්ඩක්වත් තරහ නෑ. කාත් කවුරුත් නැති මම ජීවිතේ ඉතිරි ටිකත් තනියමම ගත කරන්නම්. දුව දැන් ලොකු හින්ද තාත්තිට කෑම ටිකක් උයල දෙන්න පුළුවන්නෙ. මම ඔයාව කුස්සියට කරගෙන වැඩපල කියල දුන්නෙ ගෑනු ළමයෙක් දෑතේ වැඩ හොඳට ඉගෙන ගෙන ඉන්න ඕනෙ නිසයි. මගෙ දුවගේ ජීවිතේ ලස්සන වෙනව කියල මම හොඳටම දන්නවා.

ඔයාට මේ ලිපිය ලැබෙන විට මම උපන් බිමෙන් සැතපුම් ගණනක් ඈතකට ගිහින්. මම ඉරිදා හවසට ලංකාවෙන් පිටත් වෙනවා. මගෙයි කියන්න කාත් කවුරුත් නැති මම ආපහු ලංකාවට එන්නෙ නෑ. ඒත් මගේ දුවට මාව කවදාකහරි ඕනෙ වුනොත් මට ලියල එවන්න. එදාට මං නොවරදවාම මගෙ දුවව බලන්න එනවා.
මගෙ දුවටත්, දුවගෙ තාත්තිටත් දෙවි පිහිට ලැබේවා.
මම
ඔයාගේ ආදරය නොලද
ආදරණීය අම්මා.

මට අදහාගත නොහැක. මගේ දෙනෙත විසල් වුණි. ඔළුවෙන් ගින්දර පිටවෙනවාක් මෙන් මට දැනේ. හදිසියෙම සිදුවූ මෙම ව්‍යසනය කුමක්ද? කෞමදි ඉකිගසමින් හඬයි.
"තාත්ති... අනේ තාත්ති.... අපි යන්... ඉන්න තැනකින් අම්මව එක්කගෙන එමු තාත්ති..."

නොමැත තරහක් ..... සිතේ කිසිවිට
වටී නුඹ මට ..... දුවක් විලසට
සිතට කඳුලක්...... නැගුන දවසට
වරක් අම්මා...... කියන් නුඹ මට...

- සමාප්තයි -

13 පිටෙන්

පහසු කටයුත්තක් නොවන බව අළුත් ආක්‍රමිකයන්ට වහා වැටහී ගියේය. නමුත් ලන්දේසීන් කෙසේ හෝ යුද්ධයට වඩා වෙළඳාම කෙරෙහි සිත යොමු කලේ, එමගින් ලැබෙන සියළුම ආදායම රජයේ ඒකාධිකාරයකට යොමු කොට දේශපාලන පරාධීනත්වය නොසලකා වෙළඳ සමාගම් මූලස්ථානයක ස්වරූපයෙන් සිය නව අයිතිය තහවුරු කර ගැනීමට උත්සාහ දැරූහ.

1672 දී හදිසියේම සියල්ලන්ම මවිත කරවමින් ප්‍රංශ නැව් කණ්ඩායමක් ත්‍රිකුණාමල වරායට සේන්දු වූ නමුදු ලන්දේසීහු ක්ෂණිකව ක්‍රියාකාරී වෙමින් සිය බලය රැක ගත්හ. දීර්ඝ පාලනයකින් පසු 1687 දී දෙවනි සිංහ රජු මිය ගියෙන්, සූරිය රජ කමට පත්විය. ඔහු කඩුවට වඩා සාමය අගය කලෙන්, බුදු දහමට නැවත පණ දෙමින් රටේ පෙර තිබු සෞභාග්‍යය හා බල සම්පන්න බව නැවත නගා සිටුවීමට මහත් සේ උත්සාහ දැරීය. ඔහුගේ අවුරුදු 22ක පාලනයෙන් පසු රජකමට පත්වූ ඔහුගේ පුත් කුණ්ඩිසාල ද සාමයට නැඹුරු වු පිලිවෙතක් දැරීය. ඒ අන් කිසිවක් නිසා නොව සිය සන්තුෂ්ඨියට බාධා පමුණුවන අන් කිසි දෙයකට රුචියක් නොවු නිසාය. නපුරු, ප්‍රතිපත්තියකින් තොර, හිතුවක්කාර පාලකයෙකු වු කුණ්ඩිසාල තරම් නරක පාලකයෙකු ලංකාවේ නොවු විරූ තරම්ය. ඔහු රටේ පාලන කටයුතු කෙතරම් බැරෑරුම් තත්වයකට ගෙන ආවේද කියතොත්, ප්‍රභූන් ඔහුට විරුද්ධව කැරලි ගසමින්, ලන්දේසීන් ගේ මැදිහත්වීමට මග පෑදූහ.

මේ කාලය වන විට හේග් සිට එවන ලද ආණ්ඩුකාර වරුන් අතර ඉතා පහත් පරමාර්ථ ඇති පුද්ගලයන් හිඟ නොවීය. වියුස්ට් නමැත්තෙකු කොපමණ ආක්‍රමණශීලී ලෙස කොල්ල කෑමේ යෙදුනේද කියතොත් බතාවියාවට ගෙන්වා, නඩු අසා, ඔහුව මරණ දඬුවමට යටත් කරන ලදී. ඔහුගෙන් පසුව එම තනතුරට පත්වී පැමිණි වර්සාලෙස් කලින් පුද්ගලයාට වඩා තරමක් හොඳ කෙනෙකු වුවත් ඔහු සහල් ඒකාධිකාරයක් පවත්වා ගෙන යමින් සිංහලයන්ට දිය හැකි උපරිම වධ හිංසා පැමිණවීය. 1732 දී ඔහුව ආපසු කැඳවා ගනු ලැබීය. නමුත්, පෝල්ක් සහ වැන් ගොළුන්ස් වැනි අය වෙනම අච්චුවල පුද්ගලයන් වු අතර, ඔවුන්ගේ කාල වලදී ලංකාව සශ්‍රික වූ අතර එහි වෙළඳාමද විශාල ලෙස වැඩි දියුණු විය.

(ඉංග්‍රීසින්ගේ පැමිණීම හා එකල ජන විත්ති මීළඟ කොටසින්)

සංක්‍රමණිකයා 24 පිටෙන්

හොතේ අපි සූදානම්. මානෙල් මල් ව්‍යාපාරය ඔස්ට්‍රේලියාව පුරා ව්‍යාප්ත කිරීමට ලබේවා යි පතනවා.

මහත්වරුණි. ආරක්ෂක හමුදා වල රට වෙනුවෙන් දිවි දෙන පහළ සාමාජිකත්වයට හා අසරණ මායිම් ගම්වාසීන්ට ඔබේ සහය අවශ්‍යයි. දෙවරක් නොසිතා මේ මොහොතේ මානෙල් මල් ව්‍යාපෘතියට සහය දෙන්න. ඔබේ යුතුකම ඉටු කරන්න.



## වෛරය ගුවනින්

තුන්වැනි ලෝක යුද්ධයක් ඇරඹෙන්නේ මැදපෙරදිගින් බව 16 වැනි සියවසේ ප්‍රංශයේ විසූ නෝස්ට්‍රදාම් නැමැති අනාවැකිකරුවා ප්‍රකාශ කර තිබේ. ඔහු පලකල බොහෝ අනාවැකි පල දැරූ බව ඉතිහාසය සාක්ෂි දරයි. මේ සිදුවෙමින් පවතින්නේ එහි මුලාරම්භයද? ඔබ මේ දකින්නේ ලෙබනනය වෙත ගුවන් ගතවීමට ඇති භයානක මිසයිල උන්ඩ මත වෛරයේ සටහන් තබන ඊශ්‍රායල් දැරියක්. මේ උන්ඩ ගුවණින් ගොස් විනාශ කරන්නේ තම වයසේම දරු දැරියන් බව ඇගේ ලපටි සිත දනී නම්....

යුද්ධයේදී කුඩා දරුවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ළමා ප්‍රඥාප්තීන් අමු අමුවේම උල්ලංඝනය කරන මේ ඊශ්‍රායල් සෙබළුන් හසරක් නොදන්නා කුඩා දරුවන් මේ කුරිරු යුද්ධයේ අනියම් ගොදුරු බවට පත් කරවීමෙන් කරගනු ලබන්නේ අනාගත පරම්පරා ගණනාවක් සඳහා වෛරය ඉතිරි කර ගැනීමක් නොවේද? ළමා සොල්දාදුවන් පිළිබඳ තුන්වැනි ලෝකයේ රටවලට අවවාද බලපෑම් කරන ලෝක ප්‍රජාතන්ත්‍රවාදයේ මුර භටයා වන ඇමරිකාව මෙයට උඩගෙඩිදීම සාධාරණීකරණය කරමින් අප රටවලට බලපෑම් කරන්නේ යුද්ධයෙන් නොව සාකච්ඡාවෙන් ප්‍රශ්න විසඳාගන්නා ලෙසයි. හරිම අපූරුයි නේද?

**සංක්‍රමනිකයා**